**මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව**

**පොළොන්නරුව දිස්ත්‍රික්කය**

**---------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන.**

**-----------------**

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 09 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 01 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2016 ජූලි 12 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 **මතය**

**------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට **මැදිරිගිරිය** ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

--------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

(i) සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් හා දෙසැම්බර් මාසවලට අදාල එකතුව රු. 174,000 ක් වූ මුද්දර ගාස්තු ආදායම මූල්‍ය ප්‍රකාශවලට ඇතුළත් කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාල රු. 759,464 ක් වූ උසාවි දඩ ආදායම මූල්‍ය ප්‍රකාශවලට ඇතුළත් කර නොතිබුණි.

(iii) ස්ථාවර වත්කම් ලේඛනයෙහි සඳහන් ඉඩම් විෂයයන් 86 ක හා ගොඩනැගිලි විෂයයන් 60 ක වටිනාකම් තක්සේරු කර, එම අගයන් ගිණුම්ගත කර නොතිබුණි.

(iv) රු. 117,927 ක් වූ කර්මාන්ත ණය ගැති ශේෂයක් සහ එම අගයට සමාන කර්මාන්ත ණයහිමි ශේෂයක් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

----------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්, කඩකුලී. බදුකුලී සහ සතිපොල බදු වශයෙන් ලැබිය යුතු එකතුව රු. 382,412 ක මුදල දීර්ඝකාලයක සිට හිඟව පවතින අතර අයකරගැනීම සඳහා පියවර ගෙන නොතිබුණි.

(ආ) 2014 වර්ෂයේ සිට අයවීමට තිබෙන රු. 1,265,025 ක් වූ කර්මාන්ත ණයගැති ශේෂය අයකර ගැනීම සඳහා 2016 අප්‍රේල් මාසය වනවිටද කටයුතු කර නොතිබුණි.

1.3.3 නීති රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

---

පහත දැක්වෙන නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | |
| (i) | රීති අංක 67 | වෙළඳ ස්ථාන සහ කර්මාන්ත පිළිබඳ වාර්ෂික සමීක්ෂණයක් කර නොතිබුණි. |
| (ii) | රීති 203,214 හා 218 | සභාවේ දේපල සම්බන්ධව පූර්ණ සමීක්ෂණයක් කර නොතිබුණි. |
| (ආ) | 2002 නොවැම්බර් 28 දිනැති අයිඑ්අයි/2002/02 දරන භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

02. මූල්‍ය සමාලෝචනය

---

2.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 7,942,753 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 5,040,603 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

---

2.2.1 ආදායම් අයකරගැනීමේ කාර්ය සාධනය

---

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 14,296,553 ක් වූ දඩ මුදලක්, රු. 2,594,969 ක් වූ වරිපනම් බදු, රු. 665,544 ක් වූ වෙනත් ආදායම් සහ රු. 192,527 ක් වූ කුලී මුදල් වර්ෂ ගණනාවක සිට අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කඩ කුලී සම්බන්ධයෙන් වර්ෂය සඳහා බිල්කල බදු මුදල හා අයවූ මුදල, ඊට අදාල කුවිතාන්සි අංක සහ බදු කරුගේ නම යනාදි විස්තර පැහැදිළිව සඳහන් කරමින් කඩකුලී ලේඛනය විධිමත් පරිදි පවත්වා නොතිබුණි. තවද කඩ කාමර සඳහා අයකරන ඇප මුදල් වෙනම ඇප තැන්පත් ලේඛනයක සටහන් කළයුතු වුවද පොදු ඇප තැන්පත් ලේඛනයක හඳුනාගත නොහැකි අයුරින් සටහන් කර තිබුණි.

(ඇ) රු. 226,281 ක හිඟ ආදායමක් 1994 වර්ෂයේ සිට ගිණුම් හා මුල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම අනාවරණය කරමින් පවතින අතර, එම මුදල අයකර ගැනිම සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ඈ) වෙළඳ බලපත්‍ර නිකුත් කිරීමේදී එම ව්‍යාපාර අයිතිකරුවන් පරිසර බලපත්‍ර ලබාගෙන තිබේද යන්න පරික්ෂා කළයුතු වුවද, එසේ පරිසර බලපත්‍ර ලබා නොගත් ව්‍යාපාර 19 ක් සඳහාද සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වූ වෙළඳ බලපත්‍ර නිකුත් කර තිබුණි.

03. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------------------------

(අ) 2015 වර්ෂයේ නොවැම්බර් හා දෙසැම්බර් මාසවලට අදාලව කඩකුලි ලේඛන යාවත්කාලීන කර නොතිබිම හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුලී ආදායම කොපමණද යන්න 2016 අප්‍රේල් මාසය වන විටත් හඳුනාගෙන නොතිබුණි

(ආ) සභාව සතු දිවුලන්කඩවල සතිපොලේ බදු දී තිබෙන කඩ කාමර 05 ක් දියසෙන්පුර කඩ කාමර යක් සහ මැදිරිගිරිය සතිපොලේ කඩ කාමර 02 ක්ද වශයෙන් බදුදී තිබෙන කඩ කාමර සඳහා ගිවිසුම්වලට එළඹී නොතිබුණි.

(ඇ) සභාවේ වාහන සහ යන්ත්‍රෝපකරණ 2014 වර්ෂයේදි සභාවේ මන්ත්‍රීවරුන් විසින් කුලි පදනම මත ලබාගෙන තිබුණු අතර ඒ වෙනුවෙන් අයවිය යුතු රු. 454,480 ක්වූ මුදල අයකරගෙන නොතිබුණි.

(ඈ) සභාව සතු පුස්තකාල තුනෙහි එකතුව රු. 114,320 ක් වටිනා පොත් 613 ක් හා වටිනාකම හඳුනාගත නොහැකි පොත් 49 ක් අස්ථානගත වී තිබෙන අතර, ඒ සම්බන්ධයෙන් පරික්ෂණයක් සිදුකර නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු ගෙවන ජනතාව වෙත ජල පහසුකම් සැපයීම, මාර්ග නඩත්තු කිරීම, කසල එකතු කිරිමේ විධිමත් වැඩපිළිවෙලක් සකස් කිරීම, වීථි පහන් නඩත්තු කිරීම, ළමා උද්‍යාන හා පෙර පාසල් පහසුකම් සැපයීම, පොදු වැසිකිළි පහසුකම් හා පුස්තකාල පහසුකම් සැපයීම සතුටුදායකව සිදු නොවන බව වරිපනම් සම්බන්ධ මහජන ආයාචනා ලිපි පරික්ෂා කිරීමේදී අනාවරණය වූ අතර එම පහසුකම් සම්පූර්ණ කිරීමට අදාල ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර ඒ අනුව අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.3 ප්රමාද වූ ව්‍යාපෘති

------------------

පළාත් සභා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම සඳහා ප්‍රතිපාදන ලබාදීම 2015 නොවැම්බර් 23 සිට 2016 ජනවාරි දක්වා කාලය තුලදී සිදුකර තිබුණු අතර, ප්‍රතිපාදන ලැබිමේ ප්‍රමාදය හා ප්‍රතිලාභීන් හඳුනා නොගැනීම, ඇස්තමේන්තු ප්‍රමාණවත් නොවීම, ප්‍රතිලාභ ලබාදීමට දින නියම නොවීම යන හේතු නිසා 2016 ජනවාරි 14 දිනය වන විටත් රු. 1,660,000 කට අදාල ව්‍යාපෘති 11 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉහත සඳහන් ව්‍යාපෘති අතුරින් රු. 550,000 ක් වූ පෞද්ගලික ස්වරූපයේ ව්‍යාපෘතිද අනුමත කර තිබෙන බව ලිපිගොනු පිළිබඳ පරීක්ෂාවේදී අනාවරණය විය.

04. යහපාලනය සහ ගිණුම් කටයුතුභාවය

---------------------------------------

4.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

------------------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ජේදය ප්‍රකාරව දිගුකාලීන දැක්මක් සහිතව ප්‍රාදේශීය සභා පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කරගැනීම ඉලක්ක කරගත් ක්‍රියාකාරකම් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර නොතිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය

-------------------------

උතුරු මැද පළාත් පාලන කොමසාරිස්ගේ 2015 මාර්තු 18 දිනැති අංක 04/2015 දරන චක්‍රලේඛයේ 6 ජේදය ප්‍රකාරව අභ්‍යන්තර විගණන නිලධාරියෙකු සභාවට පත්කර ගෙන තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සභාව තුල සිදුවී නොතිබුණි.

4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරිම

----------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේදී සහ ඉකුත් වර්ෂවලදීද විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කර නොතිබුණි.

4.4 වත්කම් කළමනාකරණය

-----------------------------

නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

---------------------------------------

සහල් පිටි සැකසුම් මධ්‍යස්ථානයේ උපකරණ කට්ටලයට අයත් විෂයයන් 22 ක්ද, ඉන්වෙන්ට්‍රි ලේඛනයට ඇතුළත් නොවූ කායවර්ධන උපකරණ කට්ටලය හා අන්තර් ගම්මාන වැඩසටහනට අදාල කාර්යාල ලීබඩු හා උපකරණ විෂයයන් 24 ක්ද, ඉන්ටර්ලොක් කොන්ක්‍රීට් ගල්කැට 3,500 ක තොගයක්ද, නිශ්කාර්ය වත්කම් ලෙස ප්‍රාදේශීය සභා පරිශ්‍රයේ තිබෙන බවට නිරික්ෂණය විය.

05. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) අදායම් පරිපාලනය

(ඈ) ණයගැති හා ණය හිමි පාලනය

(ඉ) වත්කම් කළමනාකරණය